

# නිකොලෝ මැකියාවෙලිගෙන්

The 'Sinhala conspiracy' theory of some Tamil thinkers apart, the expected crossover of opposition UNP members of parliament to the ruling SLFP could render the pre-requisite of a 'southern consensus' to any peace settlement, a non-starter all over again.

Sathiya Moorthy - Director, Chennai Chapter of the observer Research Foundation (ORFC), an Indian policy think-tank, headquartered in New Delhi

මෙම උපුටා ගැනීම ''ඩේලි මිරර්'' පුවත්පතේ පසුගියදා පළ වූ ලිපියකිනි. එම ලිපිය මතුකරන ආකාරයට අනුව මෑතකදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු කොටසක් එකතුවීම සමහර ද්‍රවිඩ න්‍යායාචාර්යවරුන් දකින්නේ, ජනවාර්ගික පක්ෂය විසඳීම සඳහා ශ්‍රී.ල.නි.ප. ය හා යූ.එන්.පී. ය විසින් ඇතිකර ගත් ගිවිසුම බිඳීම සඳහා වන ''සිංහල මහ ජාතියේ'' කුමන්ත්‍රණයක් බවයි. මේ සමගම එක්සත් ජාතික පක්ෂයේ සභාපති රුක්මන් සේනානායක ප්‍රකාශ කලේ හඳුනා ගත් ක්ෂේත්‍ර හයක් හා ප්‍රධාන වශයෙන් ජනවාර්ගික ප්‍රශ්නයට සාකච්ඡා මාර්ගයෙන් දේශපාලන විසඳුමක් ලබාදීම සඳහා වූ දින සියයක් පැරණි ''අවබෝධතා ගිවිසුම'' අවලංගු කරන බවයි.

මෙය සිංහල ජාතියේ කුමන්ත්‍රණයක්ද? නැද්ද? නිශ්චය කිරීම පාඨකයාට බාර කරන අතර, මෙම ලිපියේ අරමුණ දෙමළ චින්තකයන්ට නොපෙනෙන දේශපාලන දෘෂ්ඨියකින් මෙම පරිසරය සාකච්ඡාවට භාජනය කිරීමයි.

''ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපති ධූරයට පත්වූ වහාම මහා මැතිවරණයකට යාම සඳහා වූ අදහස පසුපසට ඇද ගත්තේ, ජනතා විමුක්ති පෙරමුණේ වූ බලකිරීම මත පමණක්ම නොවේ. එවකට එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයෙහි වූ ප්‍රතිවිරෝධතාවයන් තුළ ''කරු ජයසූරිය'' වෙත එම පක්ෂ නායකත්වය ලැබේවි යැයි වූ සැකය ද බලපෑ බව එවකට දේශපාලන විචාරකයන් පෙන්වා දී තිබුණි. එසේ කළේ ජයසූරිය මහතා නායකත්වයට පත්වූයේ නම් සිදුවන දේශපාලන අරගලය එතරම් පහසු නොවනු ඇතැයි ජනාධිපතිතුමා කල්පනා කල හෙයිනි.

## විචාරය

අධිනීතිඥ **ලක්ෂ්මන් වැලිවිටිය.**

කරු ජයසූරිය යනු සරම - බැනියම අපූරුවට අඳින දේශපාලනඥයෙකි. ඔහු සිංහල, බෞද්ධ නායකයෙකි. ඔහු ෆෙඩරල්වාදියෙකු සේ වුවත්, තදබල ලෙසම ෆෙඩරල්වාදය වෙනුවෙන් පෙනී නොසිටින්නෙකි. පෙනී සිටියත්, බෞද්ධ ෆෙඩරල්වාදියෙකි. ඔහු බෞද්ධ නායකයෙකු ලෙසින් සමාජය නියෝජනය කරයි. ඔහුගේ සැබෑ බෞද්ධ ස්වරූපය පෙනී යන්නේ ඔහු නැවතත් උපනායකත්වයට පත් කරන ලෙස මහනායකවරු විසින්ම රනිල් වික්‍රමසිංහ ගෙන් කරන ලද ඉල්ලා සිටීමෙන් ය.

අනෙක් අතට මෙම වසර ආරම්භයේ කරු ජයසූරිය හා ජනාධිපති එක් වී කිරිබත් රස විඳීමට ගියේ දකුණේ ප්‍රබල නාහිමි නමකගේ මැදිරියකටය. එම නිසාම දේශපාලන විචාරකයන් පැවසුවේ තවත් සරම හා බැනියම අඳින කරු ජයසූරිය වැන්නකු ප්‍රතිවාදියකු කොට ගැන්ම ගැන මහින්ද රාජපක්ෂ දෙසැරයක් සිතා බලන බවය. මෙමගින් අනාගතයේ තමාට එරෙහි විය හැකි සිංහල බෞද්ධ නායකත්වයක් මහින්ද රාජපක්ෂ විසින් අපූරු ලෙස නතු කර ගන්නා ලදී. එය එක්සත් ජාතික පක්ෂයේ තිබූ ජාතිකත්ව ප්‍රවාහය නැති කර දැමීමකි.

මෙය එක් පැත්තකින් ජේ.ආර්. ජයවර්ධන විසින් සිරිමා බණ්ඩාරනායක අකර්මන්‍ය කල ක්‍රමයේම අනෙක් පැත්තකි. මෙහි තවත් පැත්තක්ද වේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ චන්ද්‍රිකා බණ්ඩාරනායක දියත් කළ හැකි යැයි රාජපක්ෂ විසින් අපේක්ෂා කරන බල අරගලය තුළ, ''බණ්ඩාරනායකවරුන්ට'' එරෙහි ගම්පහ දිස්ත්‍රික්කය තුළ පාවිච්චි කල හැකි ප්‍රබලම සාධකය ලෙස කරු ජයසූරිය පෙරට ගැනීමයි. කරු ජයසූරිය හරහා බණ්ඩාරනායක වරුන්ට අභියෝග කිරීමට මහින්ද රාජපක්ෂට එතරම් අසීරු නොවනු ඇත. පසුගියදා ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ ප්‍රකාශ කර සිටියේ කරු ජයසූරිය, ගම්පහ දිස්ත්‍රික්කයේ නායකත්වයට ගෙන ඒම සඳහා තමන්ට කළ හැකි සියල්ලක්ම කරනා බවය.

*<u>ඒ කෙසේ පැමිණියත් පැමිණෙන ප්‍රමාණයට සීමාවක් ද ඇත. ඒ රනිල් වික්‍රමසිංහ ගේ විපක්ෂ නායක ධූරයට හානි නොවන ප්‍රමාණයටය. ජනතා විමුක්ති පෙරමුණේ ඇති මන්ත්‍රීධුරාපේක්ෂක ගණන නොඉක්මවන මට්ටමට එය සීමා වනු ඇත.</u>*

මහින්ද රාජපක්ෂගේ ස්ථාවරය කලඑළි බැස්සේ ඒ ලෙසිනි. එක ගලෙන් කුරුල්ලන් දෙදෙනෙකු බිම වැටී ඇත. අනෙක් අතට මෙම ක්‍රියාමාර්ගය හරහා යූ.එන්.පී. ය ගරා වැටෙනු ඇත. එම පක්ෂයෙන් තව තවත් මන්ත්‍රීවරුන් ආණ්ඩුවට එකතු වනු ඇත. ඒ කෙසේ පැමිණියත් පැමිණෙන ප්‍රමාණයට සීමාවක් ද ඇත. ඒ රනිල් වික්‍රමසිංහ ගේ විපක්ෂ නායක ධූරයට හානි නොවන ප්‍රමාණයටය. ජනතා විමුක්ති පෙරමුණේ ඇති මන්ත්‍රීධුරාපේක්ෂක ගණන නොඉක්මවන මට්ටමට එය සීමා වනු ඇත. විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ අතම තැබිය යුතුය. අරගලකාරී ජනතා විමුක්ති පෙරමුණට විපක්ෂ නායකත්වය ලබාදීමට ඔහු කිසිසේත්ම ඉඩදෙන්නේ නැත.

බලයට පත්වීම සඳහා වූ ''අඹයහළුකම'' දැන් අවසන් වී ඇත. මහින්ද රාජපක්ෂ පමණක් නොව චන්ද්‍රිකා බණ්ඩාරනායක ද, පැහැදිලි ලෙසම මෙම ස්ථාවරය පවත්වාගෙන ගියෝය. එනම් රනිල් වික්‍රමසිංහ සැමවිටම තම ප්‍රතිවාදියා ලෙස තබා ගැනීමය. ''බටලන්ද පරීක්ෂණ'' වලදී චන්ද්‍රිකාගේ වුවමනාව වූයේ රනිල්ව කෙනිත්තීමට විනා සහමුලින්ම අවලංගු කිරීම නොවේ යැයි එවකට දේශපාලන නිරීක්ෂකයෝ සඳහන් කොට තිබුණි. එසේම මහින්ද රාජපක්ෂ විසින්ද, කෙතරම් යූ.එන්.පී. මන්ත්‍රීවරුන් බා ගත්තත් එය විපක්ෂ නායකත්වය රනිල් වික්‍රමසිංහ අතට, තබා ගැනීමට අවශ්‍ය ප්‍රමාණය දක්වා වනු ඇත. එවන් නායකත්වයක් සමඟ තරග කොට නැවතත් පහසු ජයක් ලබා ගැනීම ඔහුගේ අපේක්ෂාව වනු ඇත.

අනෙක් අතට ජනාධිපතිවරයාගේ අනෙක් ප්‍රධාන කාර්ය වනුයේ ''බණ්ඩාරනායකවරු'' සෝදා හැරීමයි. ජනාධිපති වරණයට පෙර මෙම ලේඛකයා සමඟ පැරණි ප්‍රවීණ වාමාංශිකයකු විසින් කරන ලද සාකච්ඡාවකදී මහින්ද රාජපක්ෂ ජනාධිපති වුවහොත්, බණ්ඩාරනායකවරු ඉවත් කරනු ඇතැයි මෙම ලේඛකයා විසින් ප්‍රකාශ කරන ලදි. නමුත් එම වාමාංශික ප්‍රවීණයා ප්‍රකාශ කළේ ''නැහැ මහින්ද එහෙම කරන එකක් නැහැ.'' යනුවෙනි. ඔහු එසේ කීවේ විකසිත මනසේ ප්‍රශ්නයක් හෝ මහින්ද එසේ නොකරන්නේ යැයි තිබූ විශ්වාසයකින් නොව, පැරණි වාමාංශිකයන්ට බණ්ඩාරනායකවරුන් වෙත ඇති අධ්‍යාත්මක බැඳීමෙන් ඉවත්වීමට ඇති බැරිකම නිසා ය. (ඇත්ත වශයෙන්ම බණ්ඩාරනායකවරු කොබ්බෑකඩුවට එරෙහිව කරන ලද කෙනෙහිලිකම්වලට සාපේක්ෂව - මෙවර මහින්ද රාජපක්ෂට කරන ලද හිරිහැර නැති තරම්ය.)

පසුගියදා නියෝජ්‍ය අමාත්‍ය නිර්මල කොතලාවල ජනාධිපති වෙත ලිපියක් යවමින් ඉල්ලා සිටියේ චන්ද්‍රිකා බණ්ඩාරනායකට එරෙහිව නැගී ඇති චෝදනා විභාග කොට, ඇය නිදහස් කිරීම සඳහා කොමිසමක් පත් කරන ලෙසය. මෙම උපඇමැතිවරයා ඇත්ත වශයෙන් මම චන්ද්‍රිකා පිලට එරෙහිව මහින්ද රාජපක්ෂ පිල සෘජුවම නියෝජනය කල කෙනෙකි. ඔහුට එක්වරටම චන්ද්‍රිකා බණ්ඩාරනායක ගැන මෙවැනි අනුකම්පාවක් පහළ වුයේ කෙසේද? පසුගිය ''ඉරුදින'' පුවත්පත ප්‍රකාශ කලේ චන්ද්‍රිකා බණ්ඩාරනායකගේ ප්‍රජා අයිතිය නැති කර දැමීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වන බවය.

එය සත්‍ය හෝ අසත්‍ය වේවා මෙය චන්ද්‍රිකා බණ්ඩාරනායක වෙත කරන ලද ප්‍රබල අනතුරු ඇඟවීමකි. එසේම මහින්ද රාජපක්ෂ මහතා ප්‍රසිද්ධ නිළි අනෝජා වීරසිංහ වෙත ඇයට වූ හානිය සඳහා වන්දියක් ප්‍රධානය කළේය. එසේම රූකාන්ත හා චන්ද්‍රලේඛා ගැනත් සලකා බලමින් සිටියි. මොවුන් සියල්ල චන්ද්‍රිකාගේ පුද්ගලික අනුදැනුම මත හානියට පත්වුවන් යැයි රාවයක් පවතියි. ''චෞර රැජිණ ග්‍රන්ථය'' හරහා නැවතත් එය කතිකාවට නැගුණි. (චන්ද්‍රිකා බණ්ඩාරනායක ප්‍රකාශ කර සිටින්නේ චෞර රැජිණ ප්‍රකාශ කිරීමට මුදල් දුන්නේ කවුරුන්ද යන්න තමන් දන්නා බවය.) මොවුන්ට කල ප්‍රදානය පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. නමුත් දේශපාලන හානියට පත් දුප්පත් යූ.එන්.පී. කාරයන් කෙතරම් සිටිත්ද? අනෝජා හා රූකාන්ත පමණක් වේදිකාවට එන්නේ මන්ද? ඒ චන්ද්‍රිකා බණ්ඩාරනායකට රිදවීම සඳහාය. අනුර,

12 වන පිටට

Design & Printed by LCP - Warnna Savinda - 0402 894 942
We Design We Print......
LCP